# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 සැප්තැම්බර් මස 19 වන දින

## II වන කොටස

## අතිරේකය

(2025.09.22 දින නිකුත් කරන ලදී)

## ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය (සංශෝධන)

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනතේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් ලෙස බඳවා ගෙන ඇති තැනැත්තන්, ආයතනයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 2 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය 2 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

# ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය (සංශෝධන)

එල්.ඩී. - ඕ 33/2023

## ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඩු නාමය*

**1.** මේ පනත 2025 අංක  දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින් මතු ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනතේ 7 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ ‘‘ආයතනයේ සංස්ථාගත සාමාජිකයෝ’’ යන වචනවල සිට ‘‘සමන්විත වන්නේ ය.’’ යන වචන දක්වා වන සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> ‘‘මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි, ආයතනයේ සංස්ථාගත සාමාජිකයන්, අධි සාමාජිකයන්ගෙන් සහ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.’’.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ ‘‘ආශ්‍රිත සාමාජිකයකුට තම නමට ඉදිරියෙන් ‘‘වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික, (ශ්‍රී ලංකා)’’ යන වචන වෙනුවට ‘‘සාමාජිකයකුට නමට ඉදිරියෙන් ‘‘වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ සාමාජික, (ශ්‍රී ලංකා)’’ යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි මිස, කිසිදු තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, "වරලත් වාස්තු විද්‍යාඥයා" හෝ "වරලත් වාස්තු විද්‍යාඥයෝ" හෝ "වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ අධි සාමාජික (ශ්‍රී ලංකා)" හෝ "වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ සාමාජික (ශ්‍රී ලංකා)" යන අභිධානය ගැනීම හෝ භාවිත කිරීම හෝ එය වාස්තු විද්‍යාව, වාස්තු විද්‍යාව පිළිබඳ සැලසුම් හෝ එහි නිරතවීම හෝ වාස්තු විද්‍යා වෘත්තිය හෝ පිළිබඳ වූ යම් පොතක, සඟරාවක හෝ වෙනත් පළකිරීමක නාමය හෝ නාමයෙහි කොටසක් ලෙස භාවිත කිරීම කරනු නොලැබිය යුතු ය.".

සැක දුරු කිරීම

**4.** සැක දුරු කිරීම සඳහා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් ලෙස බඳවා ගෙන ඇති තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි, ආයතනයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.